පුවත් හසුන

ICRC

ශ්‍රී ලංකාව

# දයාවේ බලය සමඟින් ලෝක රතු කුරුස සහ රතු අඩසඳ දිනය සැමරීම

2022 මැයි



**තම ප්‍රජාවන්හි ජනතාව උදෙසා උපකාර කරන, ඔවුන් රැකබලාගන්නා සහ ජීවිතාරක්ෂක සේවාවන් පිරිනමන ලක්ෂ සංඛ්‍යාත ස්වේච්ඡා සේවකයන්ගේ කැපවීම, දයාව, ධෛර්යය සහ දායකත්වය සැමරීම පිණිස සෑම වසරකම, මැයි 08 වැනිදා ලෝක රතු කුරුස සහ රතු අඩසඳ දිනය නියම කර ඇත. මෙම වසරේ තේමාව, “දයාවේ බලය කෙරෙහි විශ්වාසය තබන්න” ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ මූලික ප්‍රතිපත්තිවලින් එකකට (මනුෂ්‍යත්වය) සමීපව සම්බන්ධ කර ස්වේච්ඡා සේවයේ පදනම කෙරෙහි ජනතාවගේ සිහිකැඳවීමක් කර ඇත.**

ශ්‍රී ලංකාවේ, ලෝක රතු කුරුස සහ රතු අඩසඳ දිනය සැමරුම ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ වව්නියාව ශාඛාවේදී පවත්වන ලදී. ජාතික සමාජය විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහනේදී වව්නියාවේ ලංකා සභා දමිළ මිශ්‍ර පාසලේදී පැවති ලේ දන්දීමකදී බොහෝ ස්වේච්ඡා සේවකයෝ “මානව දයාව” සංකේතවත් කරමින් ලේ පරිත්‍යාග කළහ. වව්නියාවේ අන්බගම් මදර් තෙරේසා නිවාසයේ අනාථ සහ ආබාධ සහිත නේවාසික තැනැත්තන් ඇතුළු 100 දෙනෙකු අතර ඇඳ ඇතිරිලි, වියලි සලාක, සනීපාරක්ෂක ද්‍රව්‍ය හා පිරිසිදු කාරක සහ රෝද පුටු බෙදාදීමක්ද සිදුවිය. අනතුරුව ස්වේච්ඡා සේවකයෝ ශ්‍රමදානයේ යෙදී පරිශ්‍රය පිරිසුදු කොට එහි ගෙවත්තේ පැල රෝපණයකින් එදින වැඩසටහන නිම කෙරිණ.

ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ මූලස්ථානයේ කාර්ය මණ්ඩල සාමාජිකයෝ, ශ්‍රී ලංකා රතු කුරුස සමාජයේ වව්නියාව සහ උතුරු පළාතේ වෙනත් ශාඛාවල පාලක මණ්ඩල සාමාජිකයෝ සහ ස්වේච්ඡා සේවකයෝ මෙන්ම ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිතයෝ එම උත්සවයට සහභාගිවූහ.

*ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානයේ කාර්ය මණ්ඩල සමාජිකයෝ සහ ස්වේච්ඡා සේවකයෝ දැනට ඇතිවී ඇති කෝවිඩ්-19, දේශගුණය ආශ්‍රිත විපත් සහ සන්නද්ධ ගැටුම් නිසා හටගන්නා අර්බුද මධ්‍යයේ විපතට පත්වූ වාර්තාගත තැනැත්තන් සමූහයකට අත්‍යවශ්‍ය ආධාර ලබාදීමෙහි නිරතවෙති. ලොවපුරා 524 දෙනෙකුගෙන් එක් තැනැත්තෙක් බැගින් (මිලියන 14.9 පිරිසක්) තමන්ගේ ප්‍රජාවන්ට ආධාර උපකාර කිරීම පිණිස ජාතික රතු කුරුස සහ රතු අඩසඳ සමාජ සමඟ ස්වේච්ඡාවෙන් සම්බන්ධවී සිටිති.*

## නීතිය බලාත්මක කිරීමේ මෙහෙයුම්වලදී යුද්ධ හමුදාව යොදා ගැනීම පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව




ජාත්‍යන්තර රතු කුරුස කමිටුව ශ්‍රී ලංකා යුද හමුදාවේ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ උපදේශකවරුන් 30 දෙනෙකු සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ තෙදින පාඨමාලාවක් පෙබරවාරි 22 දා සිට 24 දක්වා කොළඹ ගෝල් ෆේස් හෝටලයේදී පැවැත්වීය.

මෙම පුහුණු පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වූයේ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සහ නීතිය බලාත්මක කිරීමේ බලතල (අත්අඩංගුවට ගැනීම, රඳවා ගැනීම, සෝදිසි කිරීම, අල්ලාගැනීම, බලය සහ ගිනිඅවි භාවිතය) ක්‍රියාත්මක කිරීමේදී මඟපෙන්වන ජාත්‍යන්තර සම්මතයන් සහ ප්‍රමිතීන් සම්බන්ධයෙන් ඇති දැනුවත්බව ඉහළ නැංවීමයි. සහභාගිවූවන්ට මඟපෙන්වීම පිණිස මෙම පාඨමාලාවේදී ප්‍රයෝගික අභ්‍යාස, සිද්ධි අධ්‍යයනයන් සහ වීඩියෝ යොදා ගන්නා ලදී.

## රතු කුරුස කමිටුව හලාවත සහ මඩකලපුවේ මෘතශරීරාගාර අලුත්වැඩියා කරයි




ජාත්‍යන්තර රතු කුරුස කමිටුව හලාවත සහ මඩකලපුවේ මෘතශරීරාගාර දෙක අලුත්වැඩියාකිරීම 2022 මාර්තු මාසයේදී නිමකළේය. මෙම වැඩසටහනේ අරමුණ වූයේ මිනිස් මළසිරුරු ගරුසරු ඇතිව මෙහෙයවීම සහතික කරමින්, ආසාදන නිවාරණය වැඩිදියුණු කිරීමයි. මෙම අලුත්වැඩියාකිරීම්වලට නිසි කාර්ය ප්‍රවාහයකට පහසුකම් සැලසීම සහ විෂබීජ මුසු අපවිත්‍ර ප්‍රදේශ වෙන් කරන අයුරින් ගොඩනැගිලි සැලැස්මවල් වෙනස්කිරීම ඇතුළත්විය. මඩකලපුවේ මෘතශරීරාගාර ගොඩනැගිල්ලේ, ශෝකයට පත් පවුල්වලට විෂබීජවලට නිරාවරණයවීමේ අවදානමකින් තොරව, මරණයට පත් සිය ප්‍රියාදරයන් ගේ දේහ දැකබලා ගැනීමට හැකිවන ආකාරයෙන් ආවෘත කොටසක් සකසා ඇත.

## ජාත්‍යන්තර රීති සහ ප්‍රමිති පිළිබඳව බන්ධනාගාර නිලධාරීන් සඳහා වැඩමුළුව




ජාත්‍යන්තර රතු කුරුස කමිටුව බන්ධනාගාර රැකවරණ සැලසීමේ ජාත්‍යන්තර රීති සහ ප්‍රමිති පිළිබඳ වැඩමුළුවක් අප්‍රේල් 27 දින අඟුණකොළපැලැස්ස බන්ධනාගාර පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්වීය. එම වැඩමුළුවෙන් නවක කාර්ය මණ්ඩලයේ 204 දෙනෙකුට ප්‍රතිලාභ අත්විය. එහිදී නෙල්සන් මැන්ඩෙලා රීති, රැඳවුම්භාරයේදී සෞඛ්‍ය ආරක්ෂණය සහ බන්ධනාගාරයේදී හිංසාකාරි ලෙස සැලකීම වැළැක්වීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කෙරිණ. බන්ධනාගාරවලට අදාළ ජාත්‍යන්තර ප්‍රමිති පිළිබඳව තවත් පුහුණු වැඩමුළු දෙකක් මෙම වසරේදී පැවැත්වීමට ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සැලසුම් කරයි.

## ජෝන්-පික්ටෙට් (Jean-Pictet) තරඟයේදී ශ්‍රී ලංකාවේ ශිෂ්‍යයෙක් ගිල්බර්ට්-ඇපොල්ලිස් (Gilbert-Apollis Prize) ත්‍යාගය ලබයි




2022 මාර්තු 18 දා සිට 26 දා දක්වා ඇල්බේනියාවේ පැවති ජෝන්-පික්ටෙට් තරඟයට, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ අනුග්‍රහයෙන්, කොළඹ විශ්වවිද්‍යාලයේ සහ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ කණ්ඩායම් සහභාගිවූහ. කණ්ඩායම් දෙකම අවසන් පූර්ව තරඟයට සහභාගිවීමට සමත් වූ අතර කොළඹ විශ්වවිද්‍යාලයේ අනුක් ධර්මසේන (ඡායාරූපයේ වම් පස කෙලවරේ) ගිල්බර්ට්-ඇපොල්ලිස් ත්‍යාගය දිනාගත්තේය.

## ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේදී ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ සම්මන්ත්‍රණයක්




ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සංවිධානය කළ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ සම්මන්ත්‍රණයක් මාර්තු 14 දින සිට 16 දක්වා බටලන්දේ ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේදී පවත්වන ලදී. දේශන සහ සිද්ධි අධ්‍යයන සම්බන්ධ කරමින් පැවැත්වූ සම්මන්ත්‍රණයට යුද, නාවික සහ ගුවන් හමුදා නිලධාරීහු 152 දෙනෙක් සහභාගිවූහ. එම පිරිසට සෞදි අරාබිය (5), රුවන්ඩා (1), සෙනගාලය (1), මාලදිවයින (1), ඉන්දියාව (3), පාකිස්ථානය (3), බංග්ලාදේශය (3), නේපාලය (2), සැම්බියාව (1), ඕමානය (1), සහ ඉන්දුනීසියාව (1), ආදී ලෙස ඉහත සඳහන් රටවලින් පැමිණි නිලධාරීහුද ඇතුළත් වූහ.

මෙම සම්මන්ත්‍රණයේදී ආවරණය කරන ලද ගැටළුවලට යුද සටන් මෙහෙයවීමේදී සහ සාමසාධක මෙහෙයුම්වලදී ජාත්‍යන්තර මානුෂවාදී නීතියේ අදාළත්වය සහ නීතිය බලාත්මක කිරීමේ රාජකාරිවලට යුද හමුදාව යොදා ගැනීම ඇතුළත්විය. ගැටුම් හා සම්බන්ධ ලිංගික ප්‍රචණ්ඩත්වය, අනතුර හමුවේ සෞඛ්‍ය ආරක්ෂණය, නාගරික යුද්ධකිරීම් හා උපස්ථම්බක සම්බන්ධතා සහ නැගී එන තාක්ෂණයන් සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ස්ථාවරය සම්බන්ධයෙන්ද සහභාගිවූවන්ට කරුණු ඉදිරිපත් කරනු ලැබීය.

# තොරතුරු සහ දත්ත
## 2021 ජනවාරි - අප්‍රේල්

### අතුරුදහන්වූ තැනැත්තන්ගේ පවුල්වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම

- අතුරුදහන්වූ තැනැත්තන් සොයාගැනීම සම්බන්ධයෙන් කරතිබූ ඉල්ලීම්වල පසුවිපරම් සඳහා පවුල් **646** ක් මුණගැසුණු අතර අතුරුදහන්වූ තැනැත්තන් **3** දෙනෙකු ලියාපදිංචි කරන ලදී;
- අතුරුදහන්වූ තැනැත්තන් **535** ගේ ඥාතීන් වෙනුවෙන් සතිපතා මනෝ සමාජීය ආධාර සැපයීමේ සැසි **1,742** ක් පැවැත්වූ අතර, ඔවුන්ගෙන් **49** දෙනෙකුට ආර්ථික, නෛතික හා පරිපාලන, අධ්‍යාපන සහ සෞඛ්‍ය අවශ්‍යතා සපුරා ගැනීම පිණිස ආධාර ලබාගැනීමට වෙනත් සම්පත් පුද්ගලයින් වෙත යොමු කරන ලදී;
- ක්ෂුද්‍ර ආර්ථික ප්‍රාරම්භණ වැඩසටහනින් ප්‍රතිලාභ ලබන **110** දෙනෙක් රජයේ පශු සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල සම්බන්ධීකරණයෙන් ව්‍යාපාර කළමනාකරණ නිපුණතා පුහුණුව ලදහ.

### රැඳවුම් තත්වයන් නිරීක්ෂණය කිරීම

- රටපුරා රැඳවුම් ස්ථානවලදී රැඳවියන් **260** දෙනෙකු වෙන් වෙන්ව හමුවූ අතර එම සංචාරවලින් සොයාගත් කරුණු රහසිගතව බන්ධනාගාර බලධාරීන් සමඟ හුවමාරු කරගන්නා ලදී;
- රැඳවුම්භාරයේ පසුවන සිය ඥාතීන් හමුවීමට යාම පිණිස පවුල් **221** කට ගමන් වියදම් දීමනාවක් සපයන ලදී;
- රතු කුරුස පණිවුඩ **20** ක් බෙදාහරින ලද අතර රැඳවුම් ස්ථානවලින් රතු කුරුස පණිවුඩ **35** ක් එකතුකර ගන්නා ලදී;
- රැඳවුම් ස්ථාන **5** ක රැඳවියන් **3,677** දෙනෙකුට සනීපාරක්ෂාව සහ විනෝදය පිණිස අවශ්‍ය යථායෝග්‍ය ආධාර සැපයිණ;
- බන්ධනාගාර මුළුතැන් ගෙවල් **2** ක් ප්‍රතිසංස්කරණය කෙරෙන අතර එමගින් රැඳවියන් **2,050** දෙනෙකුට ප්‍රතිලාභ අත්වෙයි;
- කෝවිඩ් -19 පැතිරීම වැළැක්වීම සහ පාලනය පිණිස මහර සහ වැලිකඩ බන්ධනාගාර රෝහල්වලට පුද්ගල ආරක්ෂණ උපකරණ පරිත්‍යාග කරන ලදී. එම පරිත්‍යාගයට පුද්ගල ආරක්ෂණ උපකරණ **7600** ක්, ලීටර් **50** බැගින් අත් පිරිසුදුකාරක හා දියර සබන් සහ ඇඟගල්වන සබන් කැට **200** ක් ඇතුළත්විය;
- මූලික රසායනාගාර උපකරණ මහර බන්ධනාගාර රෝහලට පරිත්‍යාග කරන ලදී;
- වායු සමීකරණයක් වැලිකඩ බන්ධනාගාර රෝහලේ මෘතශරීරාගාරයට පරිත්‍යාග කරන ලදී;

- රඳවුම් ස්ථාන **5** ක සෞඛ්‍ය ආරක්ෂණය කෙරෙහි අවධානය යොමු කරමින් චාරිකා **8** ක යෙදුණේය;
- රැඳවියන්ට අදාළ වෛද්‍ය නීති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළු **2** කට බන්ධනාගාර වෛද්‍ය නිලධාරීහු **38** දෙනෙක් සහ අධිකරණ වෛද්‍ය නිලධාරීහු **20** දෙනෙක් සහභාගිවූහ. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ ආධාර ඇතිව එම වැඩමුළු පවත්වන ලද්දේ ශ්‍රී ලංකා අධිකරණ වෛද්‍ය විද්‍යාඥයන්ගේ විද්‍යාලය (The College of Forensic Pathologists of Sri Lanka) විසිනි.

## මානුෂවාදී නීතිය ප්‍රවර්ධනය කිරීම

- ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ හොංකොං රතු කුරුස සමාජය ඒකාබද්ධව සංවිධානය කළ, මාර්තු 09 දා සිට 11 දක්වා පවත්වන ලද අතථ්‍ය ආසියා-පැසිපික් වාද උසාවි තරඟයේදී කණ්ඩායමක් කොළඹ විශ්වවිද්‍යාලය නියෝජනය කළේය;
- ජාත්‍යන්තර රතු කුරුස කමිටු කණ්ඩායම විසින් ජනවාරි 24 දා සිට 27 දින දක්වා කුකුළේගඟ ශ්‍රී ලංකා සාම ආධාර මෙහෙයුම් අභ්‍යාස ආයතනයේදී පවත්වන ලද සිව්දින උසස් ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ පාඨමාලාවට මානුෂවාදී නීතිය පිළිබඳ උපදේශකවරු **20** දෙනෙක් (යුද හමුදාවෙන් **17**, ගුවන් හමුදාවෙන් **2**, විශේෂ කාර්ය බලකායෙන් **1**) සහභාගිවූහ;
- ශ්‍රී ලංකා සාම ආධාර මෙහෙයුම් අභ්‍යාස ආයතනයේදී එක්සත් ජාතීන්ගේ මාණ්ඩලික නිලධාරි පාඨමාලාව හදාරණ නිලධාරීන් **31** දෙනෙකුට ජාත්‍යන්තර රතු කුරුස කමිටු කණ්ඩායම විසින් දින භාගයක ප්‍රචාරණ සැසියක් මාර්තු 3 දා කුකුළේගඟ දී පවත්වනු ලැබීය;
- ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල නිලධාරීන් **30** දෙනෙකුට සටන් රීති පිළිබඳ 5 ස් දින පාඨමාලාවක් සන්රිමෝ හි මානුෂවාදී නීතිය පිළිබඳ ජාත්‍යන්තර ආයතනයේ හමුදා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (කර්නල් මාර්ක් ඩේකර්ස්) විසින් මාර්තු 7-11 දිනවලදී කොළඹ ගෝල් ෆේස් හෝටලයේදී පවත්වන ලදී;
- අලුතින් පිහිටුවන ලද කොළඹ ජාතික ආරක්ෂක විද්‍යාලයේදී ජාත්‍යන්තර රතු කුරුස කමිටුව විසින් මාර්තු 20 දින පවත්වන ලද යුද සටන්වල නව තාක්ෂණය සහ ජාත්‍යන්තර මානුෂවාදී නීතිය පිළිබඳ දේශනයට සන්නද්ධ හමුදාවල සහ පොලීසියේ නිලධාරීහු **31** දෙනෙක් සහභාගිවූහ.

## ශ්‍රී ලංකා රතු කුරුස සමාජයට ආධාර ලබාදීම

- ශාඛා ආපදා ප්‍රතිචාර ශිල්ප ක්‍රම සහ කඳවුරු කළමනාකරණය සම්බන්ධයෙන් ස්වේච්ඡා සේවකයන් **82** කු පුහුණු කරන ලදී;
- මානුෂවාදී ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර රතු කුරුස සහ රතු අඩසඳ සංවිධානය පිළිබඳ සැසි **14** ක් සංවිධානය කරන ලදී;
- ආපදා අවස්ථාවලදී මානුෂවාදී අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා රතු කුරුස සමාජය යුද හමුදාවේ හමුදා පාසලේදී කඳවුරු කළමනාකරණ පුහුණුවක් ලබාදුන්නේය;
- මෝසම් වැසි කාලයේදී ඇතිවිය හැකි අවශ්‍යතා වෙනුවෙන් ඇඳ ඇතිරිලි **1,600** ක් සහ නිදන පැදුරු **1,300** ක තොගයක් රැස්කර තැබීමක් සිදුකර ඇත;
- දිස්ත්‍රික් මට්ටමේ උත්සව වලදී ප්‍රථමාධාර සේවා **3** ක් පැවැත්වීය;
- ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ ශ්‍රී ලංකා රතු කුරුස සමාජය ඒකාබද්ධව දීප ව්‍යාප්ත ලෙස පවත්වන පවුල් සමඟ සම්බන්ධතා නැවත පිහිටුවීමේ අවශ්‍යතා තක්සේරුවේ අංගයක් වශයෙන් දුරකථන මාර්ගයෙන් සහ මුහුණට මුහුණලා සම්මුඛ සාකච්ඡා **55** ක් පවත්වන ලදී.


**ජාත්‍යන්තර රතු කුරුස කමිටුව**
29, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05
ශ්‍රී ලංකාව
දුරකථන: +94 (11) 250 33 46
ෆැක්ස්: +94 (11) 250 33 48
ඊ මේල් : colombo@icrc.org
වෙබ්: www.icrc.org

**මඩකලපුව කාර්යාලය**
මන්රේසා පාර
පිල්ලයාරඩි මඩකලපුව
දුරකථන: +94 (0)65 222 70 70

**වව්නියාව කාර්යාලය**
70, වයිරවර් කෝවිල පාර,
වයිරවර්පුලියන්කුලම්, වව්නියාව
දුරකථන: +94 (0)24 222 28 55
ෆැක්ස්: +94 (0)24 222 25 37

facebook.com/icrc
twitter.com/icrc
instagram.com/icrc


ICRC


කවරයේ ඡායාරූපය: ශ්‍රී ලංකා රතු කුරුස සමාජය (SLRCS)
© ICRC, ජූනි 2022



1869/259 06.2022